www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජෙනරාල් මැක් ක්‍රිස්ටල් නෙරපාහලේ කුමක් නිසා ද ?

## Why was General McChrystal fired?

2010 ජූනි 25

ජෙනරාල් මැක් ක්‍රිස්ටල් ඉවත් කිරීමට මූලික හේතුව ඔහු සහ ඔහුගේ ආධාරකරුවන් විසින් රෝලින් ස්ටෝන් සඟරාවේ පලකල ලිපියකින් ජනාධිපති ඔබාමා හා අනෙක් සිවිල් නිලධාරීන් සම්බන්ධයෙන් කල අවඥාසහගත ප්‍රකාශ නොවන බව ඔහුගේ නෙරපීම කෙරෙහි එක්සත් ජනපද පාලනාධිකාරය දක්වන ප්‍රතිචාරවලින් පෙන්නුම් කරයි.

ඊට වඩා ලිපියෙන් එලිමහනට ගෙන ඇත්තේ, වොෂිංටනයේ යටත්විජිත-ස්වරූපයේ යුද්ධය කෙරෙහි ඇෆ්ගනිස්ථානය තුල වැඩෙන ජනතා විරෝධය මර්දනය කිරීමට එක්සත් ජනපද මිලිටරියේ අසමර්ථතාවෙන් පැනනැගෙන අර්බුදයයි. මැක්ක්‍රිස්ටල්ගේ නායකත්වය සමඟ ඔබාමා පාලන තන්ත්‍රයේ අසන්තුෂ්ටිය වැඩීම ඇරඹුනේ පසුගිය පෙබරවාරි මස මර්ජාහ්හි දියත් කල මෙහෙයුම අසාර්ථක වීමත් සමඟය. කන්දහාර් මෙහෙයුම අවම වසයෙන් මාස තුනක් දක්වා පමා කරන බවට මෙම මස මුලදී කල නිවේදනය පලල් වසයෙන් සැලකුනේ ලජ්ජා සහගත පරාජයක් වසයෙනි.

ඉරාක වැසියන් දහස් ගනනක් ඝාතනය කිරීමට වගකිව යුතු, ත්‍රස්ත විරෝධී යුද කෙලියේ නිර්දය හමුදා නිලධරයෙකු වසයෙන් මැක් ක්‍රිස්ටල්ගේ කුප්‍රකට භාවය තිබියදී ම, සිවිල් වැසියන්ගේ මරන පිලිබඳව ඔහුගේ අනවශ්‍ය සැලකිල්ල නිසා ඇෆ්ගනිස්ථානය තුල මෙහෙයුමේ බලපෑම අඩපනවී තිබීම පිලිබඳව ජෙනරාල් මෑතකදී බෙහෙවින් වැඩීගිය විවේචනවල ඉලක්කය වී තිබින.

එහෙත් එම සැලකිල්ල සමඟ මානුෂීය සලකාබැලීම් කිසිවක් තිබුනේ නැත. ඊට වඩා, එය පදනම්ව පැවතියේ, *රෝලින් ස්ටෝන්* ලිපියේ සඳහන් මැක් ක්‍රිස්ටල්ගේ "කැරලිකාරී ගනිත සූත්‍රය" වන, මරා දමන සෑම අහිංසක සිවිල් වැසියෙකුගෙන්ම නව සතුරන් දහ දෙනෙකු නිර්මානය වේ යන සීතල ගනන් බැලීම මතය.

මයිකල් හේස්ටින්ග්ස් විසින් ලියන ලද ලිපිය තුල ඇෆ්ගිනිස්ථානයේ එක්සත් ජනපද සිවිල් නිලධාරීන් පිලිබඳව මැක් ක්‍රිස්ටල් සහ ඔහුගේ ආධාරකරුවන්ගේ ප්‍රකාශ ගැන සඳහන් කරන්නේ සාපේක්ෂව කෙටියෙන්ය. පෙරදැකිය හැකි ලෙසම ඒවා සරල වන අතර පෙන්ටගනයට තබා ඔබාමාගේ පවා මවිතයට හේතුවිය හැක්කේ යන්තමිනි. ඒවා මැක් ක්‍රිස්ටල්ගේ බල ඇනියේ ෆැසිස්ට්වාදී සහ නීච හැසිරීම සමඟ බෙහෙවින් ගැලපෙන ඒවාය. ජෙනරාල්ගේ කාර්යමන්ඩලය "ඝාතකයන්, ඔත්තුකරුවන්, නිපුනයන්, ජාතිවාදීන්, දේශපාලන ක්‍රියාධරයින් හා වෛරී උන්මත්තකයින්ගෙන් අහුලාගත් කල්ලියක්" බව හේස්ටින්ග්ස් කෙටියෙන් විස්තර කරයි.

ඔබාමා, උප ජනාධිපති ජෝසප් බිඩෙන් හා විශේෂ නියෝජිත රිචඩ් හෝල්බෲක් පිලිබඳව මැක්ක්‍රිස්ටල් නැගූ විවේචන ඉහල මාධ්‍ය අවධානයක් දිනා ගත්තේය. එහෙත් එක්සත් ජනපද යුද භටයන්ට ඇෆ්ගන් සිවිල් වැසියන්ගේ නිවාස වෙත ඇතුල්වීමේ හැකියාව අවහිර කරමින් සහ සිවිල් වැසියන් ඉලක්ක විය හැකි තැන්වලට ගුවන් හා කාලතුවක්කු ප්‍රහාර යොදාගැනීම සීමාකිරීමට එකඟවන ලෙස බල කෙරෙන නීති මඟින් මැක් ක්‍රිස්ටල් ඔවුන්ගේ දෑත් බැඳ දමා තිබීම පිලිබඳව ඇමරිකානු සොල්දාදුවන් නඟන චෝදනාවලට හේස්ටින්ග්ස් සැලකිය යුතු ඉඩක් වෙන්කර ඇත.

"එක්සත් ජනපද මිලිටරිය යුද කලාපයකදී මුහුනදිය හැකි සිවිල් වැසියන්ගේ වැඩිම හානි ඇතිවීම වැලැක්වීමට මැක් ක්‍රිස්ටල් තදබල නිතීවලින් සමහරක් යොදාගත්තේ"යයි හේස්ටින්ග්ස් ලියයි. ඔහු මෙසේ ද ලියයි: "එහෙත් මැක්ක්‍රිස්ටල්ගේ මූලෝපාය කවරක් විය හැකි වුවත්, ඔහුගේ නව මෙහෙයුමේ නියෝග ඔහුගේම භට කන්ඩායම් අතර දැඩි මතභේදයට හේතු විය. ඔවුන්ගේ වෙඩිතැබීම් නතරකරන ලෙස කීමෙන්, තමන් ඉමහත් අවදානමකට ඇද දැමූ බව සොල්දාදුවෝ චෝදනා කලහ. ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ වසර ගනනක් ගතකල හිටපු විශේෂ කාර්ය බලකායේ අයෙක් මෙසේ පැවසීය. "පහලම ස්ථරය"? කොටින්ම කියතොත් මැක්ක්‍රිස්ටල්ගේ පස්සට පයින් පහරක් දීමට මට හිතෙනවා. සොල්දාදුවන්ට ඔහුගේ නියෝගවලට එකඟ

වෙන ලෙස බලකිරීමෙන් සොල්දාදුවන් ඉමහත්ම අවදානමට ඇදල දැම්මා. සෑම සත්‍යවාදී සොල්දාදුවෙක්ම මේ දේම ඔබට කියාවි."

කන්දහාර්වලට යාබද ප්‍රදේශයකදී මැක්ක්‍රිස්ටල් හා කලකිරීමට පත් හට කන්ඩාම් අතර පැවති රැස්වීමක් විස්තර කරමින් හේස්ටින්ග්ස් මෙසේ ලිවීයඃ "ප්‍රචන්ඩ ලෙස බලය යෙදීමට අවසර නොදීම ගැන, හමුදා භාරයේ සිටි ත්‍රස්තවාදීන් සාක්කි නොමැති නිසා නිදහස් කර හැරීම පිලිබඳව, සොල්දාදුවෝ චෝදනා කලහ. ඉරාකයේදී හා මැක්ක්‍රිස්ටල්ට පෙර ඇෆ්ගනිස්ථානයේ දී සටන් කල අයුරින් සටන් වැදීමට ඔවුන්ට අවශ්‍ය විය."

මෙම මතය යථාර්ථ වසයෙන්ම සොල්දාදුවන් අතර පැතිර පැවතියේ ද නැද්ද යන්න අපැහැදිලිය. එහෙත් මෙම තර්කය වොෂිංටනයේ ප්‍රතිපත්ති සම්පාදක ප්‍රභූව තුලත් මාධ්‍ය තුලත් සහය දිනා ගනිමින් තිබෙන අයුරක් පෙනී යයි. හේස්ටින්ග්ස් ඔහුගේම මතය හා වඩාත් පලල් වසයෙන්, පාලන සංස්ථාපිතය පැත්තේ මැක්ක්‍රිස්ටල්ගේ විවේචකයන්ගෙන් බොහෝ දෙනෙක්ගේ මතය, ඔහු පහත සඳහන් ආකාරයෙන් කතා කරන විට එලිමහනට පැමිනෙයිඃ "ඇෆ්ගනිස්ථානය සම්බන්ධයෙන් ගත්කල ඉතිහාසය, මැක්ක්‍රිස්ටල්ගේ පැත්තේ නැත. මෙහිලා මොනයම්ම හෝ සාර්ථකත්වයක් ලැබූ එකම විදෙස් ආක්‍රමනිකයා වූයේ ගෙන්ගිස් ඛාන් වන අතර මානව හිමිකම්, ආර්ථික සංවර්ධනය සහ මාධ්‍ය විවේචන වැනි දේවල් මඟින් ඔහු කරදරයට පත් කලේ නැත."

ජනරාල් ඔහුගේ ඉල්ලා අස්වීම ඉදිරිපත් කල, ඔබාමා මැක්ක්‍රිස්ටල් අතර ධවල මන්දිරයේ පැවති හමුවට පෙරාතුව, සී.ජේ. චයිවර්ස් යන ඇෆ්ගන් යුද වාර්තාකරුගේ "යුද්ධයේ නීතිවලින් සිත්තැවුලට පත් රන ශූරයෝ" නම් සිරස්තලය රැගත් ලිපියකින් බදාදා දින *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත එහි තත්වය මැන බැලුවේය.

ලිපියෙන්, එක්සත් ජනපදය "අත්වැසුම් ඉවත්කර" ඇෆ්ගන් ජනතාවට එරෙහි ප්‍රහාරය ප්‍රචන්ඩකාරී ලෙස උත්සන්න කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙයි. ගුවන් හා කාලතුවක්කු ප්‍රහාර සීමා කිරීම පිලිබඳව මැක්ක්‍රිස්ටල් විවේචනය කරන නිර්නායක සොල්දාදුවන් උපුටා දක්වන චයිවර්ස් මෙලෙස සඳහන් කරයිඃ "ඇෆ්ගනිස්ථානයේ ප්‍රචන්ඩත්වය තීව්‍ර වෙමින් පවතිද්දී, යුද්ධය ගෙන යන්නේ කෙසේද යන්න පිලිබඳව හට කන්ඩායම් වෙලාගෙන ඇති වඩාත් අවුල් සහගත ප්‍රශ්න අතර පැහදිලි හා වර්ධනය වෙමින් තිබෙන හැඟීම වන්නේ විෂ ප්‍රහාර කවදා කෙසේ යොදා ගත යුතුද යන්නයි."

ඔහු මෙසේ ද ලියයිඃ "හමුදා රෙගුලාසි මගින් අවදානම, ඇෆ්ගන් ජනතාවගේ සිට බටහිර සටන්කාමීන්, එනම්, තරුන නිලධාරීන් ද අලුතික් බඳවා ගත් සොල්දාදුවන් හා මැරීන් භටයින්. වෙත මාරු කර යවා ඇත. ඔවුන්ගේ දෑත් බැඳ දමා සිටීම පිලිබඳව කතා කරති. . . ."

"බොහෝ සිවිල් වැසියන් මරා දැමිය හැකි පරිදි නීති ලිහිල් කිරීමක් පිලිබඳව උපදෙස් දීමට කිසිවෙකුට අවශ්‍ය නැත," එහෙත් *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත ඉඳුරාම ඉල්ලා සිටින්නේ ද මෙයයි.

*ටයිම්ස්* පුවත්පත, "මැක්ක්‍රිස්ටල්ගෙන් පසු ඇෆ්ගනිස්ථානය" යන හිසින් බ්‍රහස්පතින්දා පලකල එහි ප්‍රධාන කතුවැකියෙන් "දැන් මිලිටරි හා සිවිල් මූලෝපායන් ගැන බරපතල තක්සේරුවක්" ඉල්ලා සිටියේය. අනතුරුව එය, ලොමුඩැහැ ගැන්වෙන බසකින් ලියුමේඃ "*කැරලිකරුවන් සැබෑ ලෙසම අතුගා දමන තෙක්ම ඔවුන්ගේ මර්දනකාරී බලය මුලුමනින්ම යලි අත්කර ගැනීමට ඔවුන් අධිෂ්ඨානයෙන් සිටිනු ඇත.* ඇතැම් රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන් ද තලිබාන් වරුන් සමඟ ඉක්මන් ගනුදෙනුවකට යාමට උපදෙස් දෙමින් සිටීම පිලිබඳ වාර්තා කනගාටුදායකය." [අවධාරනය ඇඳින].

ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂ ප්‍රතිපත්ති සම්පාදන ක්ෂේත්‍රයේ අධිකාරිවත් හඬ විසින් නිකුත් කෙරුන මෙම ප්‍රකාශය, මැක්ක්‍රිස්ටල් නෙරපීමට සම්බන්ධ ගැඹුරට දිවෙන ප්‍රශ්න වෙත ආලෝකයක් හෙලයි. පෙනීයන පරිදි ටයිම්ස් පුවත්පතට අනුව, වසර අටකට වැඩි යුද කාල පරිච්ඡේදය අතරතුර එක්සත් ජනපදය, විදේශ ආක්‍රමනයට එරෙහිව ඇෆ්ගනිස්ථානය තුල "බරපතල ලේ වැගිරවීමේ" කාර්යය සැලකිය යුතු ශක්තියකින් කරගෙන ගොස් නොමැත.

දැනටමත් දස දහස් ගනනක් ඇෆ්ගන්වරුන් එක්සත් ජනපද-නේටෝ හමුදාවන් විසින් මරා දමා ඇත. තවත් දස දහස් ගනනක් තුවාල ලබා, එක්සත් ජනපද කඳවුරුවල සිරගත කර හෝ වධබන්ධනයට ලක් වෙමින් සිටී. වොෂිංටනය සිය ගොදුරු බවට පත්වූවන්ගේ ගනන් හිලව් ගැන එතරම් උනන්දුවක් නොදක්වන තත්වය තුල, සංහාරයේ සම්පූර්න තරම කිසිවෙකුත් නොදනී.

මෙම ඝාතන හා ත්‍රස්ත කිරීමේ මෙහෙයුම, විජිතකරන ආක්‍රමනිකයාට එරෙහිව ජාතික විමුක්තිය සඳහා ඇෆ්ගන් මහජනතාව ගෙනයන මුලුමනින්ම යුක්තිසහගත අරගලය ලේ විලක ගිල්වා දැමීමේ අරමුනින් දියත් වෙන්නකි. වසර අටක යුද්ධයකටත්, එක්සත් ජනපද ත්‍රස්තවාදී ක්‍රියා හා කුපිත කිරීමේ දශක තුනකටත් පසුව එය මුහුන දෙන ප්‍රමුඛතම ප්‍රශ්නය වන්නේ ඇමෙරිකානු අධිරාජ්‍යවාදයට එරෙහිව ඇෆ්ගන් ජනතාවගේ විරෝධය තව තවත් ලියලමින් තිබීමයි.

එක්සත් ජනපද පාලක ප්‍රභූව සතුව ඇති පිලිතුර ඇෆ්ගන්වරුන් සමූලඝාතනය කිරීමයි.

ඇෆ්ගනිස්ථානයේ යුද්ධය මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයක් වන අතර එහි නිරතවන්නවුන් යුද අපරාධකරුවන් ය.

එක්සත් ජනපදයේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තියේ විරුද්ධත්වය මතුකර ගැනීමේ අරගලය පනගැන්විය යුතුය.

බැරී ග්‍රේ

© www.wsws.org